# පුවත් හසුන

උක් පර්යේෂණ ආයතනය

වෙළුම 8 කාණ්ඩය 1 — දෙසැම්බර් 2017


## සරුසාර උක් වගාවක් සඳහා

# නව උක් ප්‍රභේද වගා කරමු

**වර්තමාන තරඟකාරී ආර්ථික පසුබිම තුල අනෙකුත් වගාකළ හැකි බෝග අභිබවා යන ආදායමක් උක් වගාව මගින් ලබා, තම ගොවි බිමෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට වගාව සඳහා තෝරා ගන්නා උක් ප්‍රභේදය ඉතාම වැදගත් වේ. එසේම උක් වගාවේ රෝග හා පළිබෝධ හානි අවම කර ගැනීමටත් නිරි අස්වනු වැඩි සංඛ්‍යාවක් ලබා වගා බිමෙන් තිරසාරව වැඩි ආදායමක් ලබාගැනීම සඳහාත් උක් ප්‍රභේදය මගින් සුවිශේෂී මෙහෙයක් සිදුවේ.**

වානිජ වගාවක් ලෙස දේශීය උක් කර්මාන්තයේ සංවර්ධනය සඳහා විදේශීය උක් ප්‍රභේද වෙනුවට දේශීයව වැඩි දියුණු කළ නව උක් ප්‍රභේද තුලින් සංවර්ධනය වන යුගයකට, උක් කර්මාන්තය රැගෙන යාමට උක් පර්යේෂණ ආයතනය සතු උක් ප්‍රභේද වැඩි දියුණු කිරීමේ වැඩසටහන මේ වන විට සමත්ව ඇත. උක් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ ක්‍රියාදාමයේදී ඉහළ ප්‍රමුඛතාවයක් දී ඇති උක් අභිජනන වැඩසටහන ලෝකයේ වෙනත් රටවල එවැනි වැඩසටහන් වලට නොදෙවැනි අභිජනන වැඩසටහනක් බවට අන්තර්ජාතික මට්ටමින් ද මේ වන විට ඇගයීමට ලක්ව ඇත. දැනටමත් ශ්‍රී ලංකා උක් කර්මාන්තය තුල මුළු උක් වගා බිමෙන් සියයට හැත්තෑවකට අධික ප්‍රමාණයකට ව්‍යාප්තව ඇති වැඩි උක් සහ සීනි අස්වැන්නක් සහිත, රෝග හා පළිබෝධ හානි වලට ඔරොත්තු දෙන උක් ප්‍රභේද උක් පර්යේෂණ ආයතනය විසින් සංවර්ධනය කර වානිජ වගාවන් සඳහා හඳුන්වා දී ව්‍යාප්ත කරන ලද උක් ප්‍රභේද වේ. ඒ අතරින් දැනට ගොවීන් අතර ඉතා ඉහළ පිළිගැනීමකට ලක්ව ඇති එස් එල් 96 128 උක් පර්යේෂණ ආයතනය විසින් සංවර්ධනය කර 2012 වසරේදී වානිජ වගාවන් සඳහා හඳුන්වා දී ව්‍යාප්ත කරන ලද ඉතා උසස් උක් ප්‍රභේදයකි.

(07 වන පිටුවට.....)

### එස්. එල්. 96 128 ට වැඩි ඉල්ලුමක්

විදේශයන්ගෙන් ආනයනය කරන ලද හා දේශියව වැඩි දියුණු කරන ලද ඉහළ අස්වනු දෙන හා හොඳ ගුණාත්මයෙන් යුත් ප්‍රභේද දෙමාපියන් ලෙස යොදා ගනිමින් මුහුම් කර වැඩි දියුණු කරන ලද ප්‍රභේද අතරින් එස් එල් 96 128 පැල්වත්ත කර්මාන්තායතනයේ වානිජ වගා හෙක්ටයාර 7,200 ක පමණ හා සෙවනගල සීනි කර්මාන්තායතනය හා ගල්ඔය වැව්ලි සමාගම ආශ්‍රිතව හෙක්ටයාර 1,700 ක් පමණ හා අතිමලේ ප්‍රදේශයේ හෙක්ටයාර 150 බිම් ප්‍රමාණයක් සඳහා යොදා ගැනීමට දැනටමත් පියවර ගෙන අත. එම ප්‍රමාණය දැනට උක් වගා කරන බිම් වලින් 60% ක් පමණ වේ. මෙම උක් ප්‍රභේදය වර්ථමානයේ භාවිතා වන ප්‍රභේද වලට වඩා 15% පමණ ඉහළ සීනි හා උක් අස්වැන්නක් ලබා දෙයි. වාරි පෝෂිත හා වර්ෂා පෝෂිත යන තත්ව දෙකෙහිදීම වගා කිරීම සඳහා නිර්දේශ කරන්නාවූ මෙම ප්‍රභේදය වාරි පෝෂිත මෙන්ම වර්ෂා පෝෂිත තත්ව යටතේදීත් ඉතා ඉහළ උක් දඬු අස්වැන්නක් ලබාදීමේ හැකියාවක් සහිත බව මේ වනවිට තහවුරු වී ඇත. සිටුවා මාස 12 හිදී උපරිම සීනි අස්වැන්නක් සහිතව අස්වැන්න නෙලා ගත හැකි මෙම ප්‍රභේදය ඉහළ නිරි අස්වැන්නක් ද ලබාදෙයි. පැල්වත්ත, හිඟුරාන හා සෙවනගල සීනි කම්හල් ආශ්‍රිත වගා බිම් වල හා උඩවලව උක් පර්යේෂණ ආයතනයේ බිම් වලද මෙම ප්‍රභේදය සාර්ථක වීම හේතුවෙන් ගොවීන්ගේ ප්‍රසාදය දිනාගෙන තිබූ සී ඕ 775 ප්‍රභේදය අභිබවා යෑමට මෙම ප්‍රභේදය දැනට සමත්වී ඇත. මෙතෙක් සෙවනගල සීනි සමාගම් ප්‍රදේශයේ ගොවීන් අතර ජනප්‍රියව වැඩි බිම් ප්‍රමාණයක ව්‍යප්තව පැවති සී ඕ 775 ප්‍රභේදය අභිබවා මුළු උක් වගාබිමෙන් 40% වැඩි භූමි ප්‍රමාණයක මෙම උක් ප්‍රභේදය මේ වනවිට ව්‍යප්තව ඇත.



ඇතුලත පිටු


- උක් වගාව ලාභදායකද?
- උක් ඉඩම්වල පාංශු ඛාදනය අවම කර ගැනීමට ක්‍රමානුකූලව බිම් සැකසීම සඳහා උදව් වන සරල උපකරණයක්
- උක් කර්මාන්ත තොරතුරු
- නිසරු උක් වගාබිම් පුනරුත්ථාපනය ප්‍රවර්ධනයට ආදර්ශන ගොවි බිම්

# උක් වගාව ලාභදායකද?



ශ්‍රී ලංකාවේ වානිජ මට්ටමේ උක් වගාව දැනට වියළි හා අතරමැදි කලාපයේ ප්‍රධාන වශයෙන් මොණරාගල හා අම්පාර දිස්ත්‍රික්කවල හෙක්ටයාර 17,000 ක පමණ ව්‍යාප්තව පවතී. මේ වන විට ක්‍රියාකාරිත්වයේ පවතින සීනි කර්මාන්තශාලා තුනක් (පැල්වත්ත, හිඟුරාණ හා සෙවනගල) ඇති අතර ඒවායේ දෛනික ඇඹරීම් ධාරිතාවය ටොන් 6,550 ක් පමණ වේ. එම කර්මාන්තශාලා වල උපරිම ධාරිතාවයෙන් වසරකට දින 200 ක් ක්‍රියාකිරීමට අවශ්‍ය උක් පමාණය ටොන් මිලියන 1.3 ක් පමණවේ. නමුත් 2016 වසරේ අඹරන ලද මුළු උක් ප්‍රමාණය ටොන් මිලියන 0.64 ක් පමණ වේ. මෙලෙස අඩු ධාරිතාවයෙන් මෙම කම්හල් ක්‍රියාකිරීම සීනි නිෂ්පාදන පිරිවැය ඉහල යාමට බලපා ඇත. මේ හේතුවෙන් අප රටේ උක් කර්මාන්තය නැංවීමට බලාපොරොත්තු වන්නේ නම් උක් කර්මාන්තශාලා උපරිම ධාරිතාවයෙන් ක්‍රියාත්මක වීම අත්‍යාවශ්‍ය සාධකයක් ව පවතී. කර්මාන්තශාලා වලට සැපයෙන උක් ප්‍රමාණය වැඩි කිරීමට ප්‍රධාන විකල්ප දෙකක් පවතී. එනම් උක් වගාකරන බිම් ප්‍රමාණය පුළුල් කිරීම සහ උක් අස්වැන්න ඉහළ නැංවීමයි. උක් පර්යේෂණ ආයතනය මගින් හඳුන්වා දී ඇති උසස් ගුණාත්මයෙන් යුත් උක් ප්‍රභේද නිවැරදි වගා පිළිවෙත් යටතේ වගා කිරීමෙන් උක් අස්වැන්න වැඩි කර ගත හැකිය. නමුත් කෘෂිකාර්මික ඉඩම් සීමාසහිත බැවින් උක් වගාකරන බිම් ප්‍රමාණය පුළුල් කිරීමට වෙනත් භෝග වගාකරන ගොවීන් උක් වගාව සඳහා යොමු කරවාගතයුතු අතර ඒ සඳහා බලපාන ප්‍රධාන සාධකය අනෙකුත් තරඟකාරී භෝගවලට සාපේක්ෂව උක් වගාවේ ලාභදායීත්වයයි.

වගාව සඳහා ජලය සපයාගන්නා ක්‍රම භේදය අනුව උක් අස්වැන්න වෙනස්වන අතර ඒ අනුව උක් වගාවේ ලාභදායීත්වයද වෙනස්වේ. ජලය සපයාගන්නා ක්‍රම භේදය අනුව ශ්‍රී ලංකාවේ උක් වගාකරන ප්‍රධාන ආකාර දෙකක් පවතී. එනම් වර්ෂාපෝෂිත හා වාරිපෝෂිත වේ. වර්ෂාපෝෂිත වගා ප්‍රදේශ ප්‍රධාන වශයෙන් පැල්වත්ත හා සෙවනගල සීනි කර්මාන්තශාලා ආශ්‍රිතවද වාරිපෝෂිත වගා ප්‍රදේශයන් සෙවනගල හා හිඟුරාන කර්මාන්තශාලා ආශ්‍රිතවද පවතී. මුළු වගා බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර 4500 ක් පමණ වාරිපෝෂිත වගා ප්‍රදේශ වන අතර උක් පර්යේෂණ ආයතනය මගින් හඳුනාගෙන ඇති පරිදි වාර්ෂාපෝෂිත ප්‍රදේශයන්හි ප්‍රධාන තරඟකාරී භෝග ඉරිඟු, උඳු, කව්පි, වට්ටක්කා හා කොමඩු වන අතර වාරිපෝෂිත ප්‍රදේශයන්හි වී සහ කෙසෙල් වේ. මෙම ලිපිය මගින් ශ්‍රී ලංකාවේ උක් වගාවන්හි ලභාදායී බව අනෙකුත් තරඟකාරී භෝග සමග සංසංදනාත්මකව ඉදිරිපත් කෙරේ. උක් හැර අනෙකුත් භෝග වල මිළ ගණන් නිරන්තර විචලනයන්ට ලක් වන නිසා 2017 වසරේ භෝගවල අස්වනු නෙලන කාලයේ පැවති මිල අනුව ගනනයන් කර ඇත.

ශ්‍රී ලංකාවේ උක් වගාකරන භූමි ප්‍රමාණය 70% පමණ වර්ෂා පෝෂිත ප්‍රදේශයන්ට අයත්වන අතර තරඟකාරී භෝග ඉරිඟු, උඳු, කව්පි, වට්ටක්කා හා කොමඩු මහ කන්නයේදී පමණක් බහුලව වගා කරන අතර යල කන්නයේදී සුළු වශයෙන් වගා කරයි. වර්ෂාපෝෂිත වගාවන් පවතින ප්‍රධාන ප්‍රදේශ වන සියඹලාණ්ඩුව, වැල්ලවාය හා බුත්තල ප්‍රදේශවල උක් වගාව හා තරඟකාරී බෝගවල ආදායම හා වියදම පහත සංසන්දනය කර ඇත. මෙහිදී උක් වගාවේ ප්‍රථම වසරේ වියදම නිරිවගාවට වඩා අධික නිසා මෙහිදී වසර හතරක සාමාන්‍ය ආදායම හා වියදම ගණනය සඳහා භාවිතා කර ඇත. එසේම බඩඉරිඟු හැර අනෙකුත් සියලු තරඟකාරී බෝග මුල් මාස 04 ක කාලය තුළ උක් වගාව සමග අතුරු භෝග ලෙස වගා කළ හැකි නිසා ගොවි මහතුන්ට ඒවා වගා කර මුල් මාස කිහිපය තුල අමතර ආදායමක් ලබා ගත හැකි වීමද විශේෂත්වයකි.

වගුව 01: වර්ෂාපෝෂිත කාලාපයේ සාමාන්‍ය පිරිවැය හා ආදායම (වසරකට/හෙක්ටයාරයට/රුපියල්)

| අයිතමය | උක් | ඉරිඟු | කව්පි | උඳු | වට්ටක්කා | කොමඩු |
|---|---|---|---|---|---|---|
| මුළු පිරිවැය | 174780 | 165510 | 129750 | 132350 | 152250 | 190550 |
| දළ ආදායම | 260000 | 202500 | 160000 | 162000 | 200000 | 250000 |
| ශුද්ධ ආදායම | 85219 | 36990 | 30256 | 29650 | 47750 | 59450 |
| යෙදවූ රුපියලක් සඳහා ප්‍රතිලාභය රුපියල් | 1.49 | 1.22 | 1.23 | 1.22 | 1.31 | 1.31 |

(03 වන පිටුවට....)

(02 වන පිටුවෙන්....)

ඉහළම දළ ආදායම උක් වගාව දරන අතර ශුද්ධ ලාභයද ඉහල අගයක් ගනී (රු:85219) (වගුව 1).

ආයෝජනය කරන ලද රුපියලක් සඳහා ඉහලම ප්‍රතිලාභය (රු.1.49) උක් වගාව මගින් ලබාදේ. උක් භෝගය එක් වරක් වගාකල විට වර්ෂ ගනනාවක් නිරි වගාව ලෙස අස්වනු ලබාගත හැක. එම නිසා ඉහල පිරිවැයක් දැරිය යුතු වන්නේ මුල් වගාව සඳහා පමණි. එසේම උක් වගාකරන ගොවි මහතුන් සඳහා පැල්වත්ත සීනි සමාගම මගින් ලබාදෙන විවිධ දිරි දීමනා නිසා වර්ෂාපෝෂිත කලාපයේ ගොවීන් අතර ලාභදායී වගාවක් ලෙස උක් ජනප්‍රිය වී ඇත.

වගුව 02 මගින් සෙවනගල වාරිපෝෂිතව උක් වගාකිරීම හා අනෙකුත් තරඟකාරී භෝග එනම් වී හා කෙසෙල් වල පිරිවැය හා ආදායම 2016/2017 වසරට අදාලව දක්වා ඇත.

වගුව 02: වාරිපෝෂිත කාලාපයේ උක් හා තරඟකාරී භෝගවල සාමාන්‍ය පිරිවැය හා ආදායම
(වසරකට / හෙක්ටයාරයට / රුපියල්)

| අයිතමය | උක් | කෙසෙල් | | වී |
|---|---|---|---|---|
| | | ඇඹුල් | කෝලිකුට්ටු | |
| මුළු පිරිවැය | 288221 | 434347 | 468965 | 256800 |
| දළ ආදායම | 500000 | 783750 | 913050 | 466250 |
| ශුද්ධ ආදායම | 211778 | 349402 | 444085 | 209450 |
| යෙදවූ රුපියලක් සඳහා ප්‍රතිලාභය රුපියල් | 1.73 | 1.80 | 1.94 | 1.81 |

■ සටහන : උක් වගාවේ අස්වැන්න හෙක්ටයාරයට ටොන් 100 ක් ලෙස ගණනය කර ඇත. වී කිලෝ ග්‍රෑම් එකක මිල රු. 50 ලෙස ගණනය කර ඇත.

වසර හතරකට අදාල සාමාන්‍ය පිරිවැයෙහි ඉහළම අගය කෙසෙල් වගාව සඳහාද අවම අගය වී සඳහාද වාර්තා වී ඇත. ශුද්ධ ආදායමේ ඉහළම අගය රු.444,085 කෝලිකුට්ටු කෙසෙල් සඳහා විය. එම අගය තෙවන වඩාත් ලාභදායී භෝගය වන උක් වලට වඩා ඉතා ඉහළ ආදායමකි. එහෙත් උක් වගාවේ මූලික පිරිවැය අඩු නිසා ආයෝජනය කරන රුපියලක් වෙනුවෙන් ඉහළම ප්‍රතිලාභය වූ සැලකිය යුතු අගයක් ගනී. එසේම උක් වගාව සාර්ථකව සිදු කර ඉහළ අස්වැන්නක් ගන්නා ගොවි මහතුන්ගේ ප්‍රතිලාභය කෙසෙල් වගාවට ඉතා ආසන්න වේ. පසුගිය කන්නයේ වී මිල අනපේක්ෂිත ලෙස ඉහළ යාම හේතුවෙන් වී වගා කළ ගොවීන්ට හොඳ ආදායමක් ලැබුණි. එහෙත් කෙසෙල් හා වී මිලෙහි වරින් වර සිදුවන අනපේක්ෂිත ලෙස පහලයාම් හා පරිසර තත්ව වෙනස්වීම් නිසා අස්වනු හානි සිදු වීම් සුලබව සිදු වේ. නමුත් උක් වගාවේදී උක් මිල ස්ථාවරව පවතින අතර පරිසර තත්ව නිසා අස්වනු හානි වීමද සාපේක්ෂව පහළ මට්ටමක පවතී. මේ අනුව වාරිපෝෂිත ප්‍රදේශවල උක් වගාව ඉතා තරඟකාරී අභියෝගයන්ට මුහුණ දෙන නමුත් ආදායම පිළිබඳ අවදානම අවම භෝගයක් ලෙස ගොවීන් අතර ප්‍රචලිතව පවතී. එසේම වාරිපෝෂිත කලාපයේදී මුං, කව්පි, උඳු, රටකජු, කොමඩු වැනි භෝග අතුරු භෝග ලෙස උක් වගාවේ මුල් මාස කිහිපය තුළ වගා කර අමතර ආදායමක් ලබාගෙන තව දුරටත් මුළු ආදායම වැඩි කර ගත හැකිය.

මේ අනුව වියළි හා අතරමැදි කලාපයේ ගොවිමහතුන් සඳහා විශේෂයෙන් වර්ෂාපෝෂිත තත්ව යටතේ වැඩි ලාභයක් ලබාගත හැකි භෝගයක් ලෙස උක් වගාව සැලකිය හැකිය. එසේම වර්ෂාපෝෂිත මෙන්ම වාරිපෝෂිත ආකාර දෙකේම අනෙකුත් භෝගවල මෙන් අස්වැන්න නෙලන කාලයේදී මිල අඩුවීමේ අවධානමක් නොමැති අතර, කාලගුණ හා අනෙකුත් හානි සිදුවීමේ අවදානමද අල්පවේ. උක් වගාවේ මුල් මාස කිහිපය තුල කව්පි, උඳු, කොමඩු, වට්ටක්කා වැනි භෝග අතුරුභෝග ලෙස වගාකර මෙම අවදානම තවත් අඩුකර අමතර ආදායමක් ද ලබාගත හැකිය. අස්වැන්න නෙලීම සඳහා වසරක පමණ කාලයක් බලා සිටියයුතු වුවද උක් වගාවේදීද වෙහෙසිය යුත්තේ මාස හතරක පමණ කාලයකි. එසේම තම ආර්ථිකය සවිමත් කරගන්නා අතරම වාර්ෂිකව සිනි ආනයනයට වැයවන වියදම අවම කිරීම තුලින් රටේ ආර්ථික සංවර්ධනයට දායකවීමේ මහඟු අවස්ථාවද උක් වගාකර සීනි කර්මාන්තශාලාවලට සැපයිය හැකි ගොවි මහතුන්ට උදාවී තිබේ.

දිනේෂ් කොඩිතුවක්කු
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
උක් පර්යේෂණ ආයතනය
උඩවලව

# උක් ඉඩම්වල පාංශු බා
# ක්‍රමානුකූලව බිම් සැකසීම සඳ

ශ්‍රී ලංකාවේ උක් වගාකරන ප්‍රදේශ අතරින් සෙවනගල හා පැල්වත්ත ප්‍රදේශ පිහිටා තිබෙනුයේ ප්‍රධාන වශයෙන් පහතරට වියළි කලාපයේ ය. මෙම ප්‍රදේශයේ බොහෝවිට රැලි සහිත භූවිෂමතාවයක් දැකිය හැකිය. බොහෝ ප්‍රදේශ 2% සිට 3% දක්වා වන සාමාන්‍ය බෑවුම් සහිත ඉඩම් වන අතර ඇතැම් ප්‍රදේශවල සියයට දහය ඉක්මවූ බෑවුම් සහිත උක් ඉඩම් ද දැකිය හැකිය. බෑවුම් සහිත ඉඩම් පාංශු ඛාදනයට පාත්‍රවීමේ හැකියාව ඉතා ඉහළ බැවින් මෙවැනි ඉඩම්වල පාත්ති සැකසීම උක් පර්යේෂණ ආයතනයේ නිර්දේශයන්ට අනුකූල වන පරිදි කිරීම අත්‍යාවශ්‍ය වේ. මෙවැනි ඉඩම් වල ජල සම්පාදනය හා ජල අපවහන කාර්යක්ෂමතාව ප්‍රශස්ත මට්ටමේ පවත්වාගෙන යාම සඳහා ද නිසි පරිදි පාත්ති සැකසීම අත්‍යවශ්‍ය වේ. තවද, වර්ෂාපතන රටාව සැලකීමේදී මෙම කලාපයට යල සහ මහ යන කන්න දෙකටම සැළකිය යුතු මට්ටමකට වැසි ලැබේ. මෙහිදී අප්‍රේල් හා ඔක්තෝම්බර් මාස වල ලැබෙන වැසි බොහෝ විට ඉහළ තීව්‍රතාවයෙන් යුක්ත වන අතර පාංශු ඛාදනය අධිකව ඇතිවීමට මෙම වර්ෂාපතන රටාවද තදින් බලපායි. උක් ඉඩම්වල පාංශු ඛාදන තත්වයන් ඇතිවන ප්‍රධාන ආකාර දෙකකි.

1. ඇලිය දිගේ බෑවුම අධික වීම නිසා එතුලින් ගලායන ජල පහරේ වේගය වැඩිවී පස සේදීයාම හෝ ගසාගෙන යාම.
2. ඇලිය දිගේ බෑවුම අවශ්‍ය ප්‍රමාණයට නොමැතිවීම නිසා එහි එක් කොටසකට ජලය එකතුවී උතුරා යාමෙන් ඇලියේ වැටිය කැඩී යාම හා පසුව බෑවුම දෙසට කුඩා අගල් ඇතිවීම.



ඇලිය දිගේ බෑවුම අධික වීම නිසා පාංශු ඛාදනය වූ අවස්ථාවක්



ඇලිය දිගේ බෑවුම අවශ්‍ය ප්‍රමාණයට නොමැතිවීම නිසා ඇලි වැටි කැඩී අගල් සෑදී ඇති ඉඩමක්

ඉහත ආකාර දෙකෙන් පාංශු ඛාදනයට ලක්වූ පසු නැවත පාත්ති නිසි පරිදි සැකසීම ඉතා අසීරු වේ. විශේෂයෙන්ම ජලසම්පාදනයේදී මෙවැනි ඇලි වලින් ජලය උතුරායාම නිසා එම ඇලියේ කෙලවර වෙත ජලය ළඟා නොවීම හා ඇලිවලින් ජලය අපතේයාම ඉහළ වීමත් සමග ජලසම්පාදනයේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාව අඩුවීම පාත්ති නිසිපරිදි සකසා නැති ඉඩම් වල සුලබව දැකිය හැකි තත්වයකි.

නිසි ජල අපවහන පද්ධතියක් හා නිර්දේශයන්ට අනුකූල වන පරිදි පාත්ති (ඇලි වැටි) සකසන ලද උක් ඉඩම්වල පාංශු ඛාදන තත්ව ඇතිවීම ඉතා අඩු මට්ටමක පවතී. ඒ සඳහ සියයට එකක හෝ ඊට අඩු බෑවුමක් ඇලිය දිගේ පවත්වා ගතයුතු වේ. මෙම බෑවුම නියමිත පරිදි සැකසීම තරමක් අසීරු කටයුත්තකි. බොහෝවිට සීසා කැට පොඩි කරන ලද ඉඩම් වල මට්ටම ලබා ගැනීම උපකරණයක් මගින් සියයට එකේ බෑවුම ලැබෙන පරිදි ලී කූඤ්ඤ ආධාරයෙන් රේඛා සලකුණු කර පසුව එම රේඛා දිගේ ට්‍රැක්ටර් මගින් පාත්ති සැකසීම කෙරේ. බොහෝවිට අක්කර හතරක ඉඩමක් සඳහා මෙවැනි රේඛා හතරක් හෝ පහක් සටහන් කිරීමට සිදුවේ. මෙම රේඛා සටහන් කිරීමේ කාර්යය සඳහා තාක්ෂණික දැනුමක් සහිත සේවකයන් අවශ්‍ය වන අතර මිලෙන් අධික මට්ටම් උපකරණ ද අවශ්‍ය වේ. මේ සඳහා සැලකිය යුතු කාලයක් ද වැය වේ.මේ හේතුව නිසා බොහෝවිට අදාල බෑවුම මෙමගින් නිසි පරිදි බෑවුමක් ලබාගැනීම ආකාර දෙකෙන්ම පාංශු ඛාදනයට ලක්වීම ඇත. ඒ අනුව, ක්‍රමාණුකූලව පාත්ති සැකසී භාවිතට පහසු සරල උපකරණයක් උක් ප

බොහෝවිට ''ලෙවල් බටය'' ලෙස උපකරණය සුළු වෙනස්කමකට ලක්කිරී සුවිශේෂතාවය වනුයේ සියයට එකේ බෑ පහසුවෙන් කියවා ගැනීමට හැකි වීමයි. ද්‍රව්‍ය පහත දක්වා ඇත.

1. මීටර් 15 ක් දිග මි.මි. 6 විශ්කම්භය (ලෙවෙල් බට ලෙස බොහෝ වෙළඳුන්
2. මීටර් දෙකක් දිග අඟල් එකහමාරේ දෙකක්
3. කුඩා හැන්ඩ් ස්ප්‍රේ (අත් ඉස්නා) නොස
4. මි.මි. 8, අඟල් 1 1/2 බෝල්ට් ඇන 0
5. පී.වී.සී. ගම් හා ත්‍රෙඩ් සීල්

මෙම සියලු අමුද්‍රව්‍ය රු. 2500.00 ක් වැනි අඩු මුදලකට දේශීය වෙළෙඳපොලෙන් මිලදී ගත හැකිය.

මෙම උපකරණයේ මිනුම් වල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා සරල පරීක්ෂණ තුනක් සෙවනගල හා උඩවලවෙ උක් ඉඩම් තුනකදී සිදු කරන ලදී. මට්ටම් උපකරණයෙන් හා මෙම සරල උපකරණයෙන් සටහන් කරන ලද රේඛා සංසන්දනාත්මකව අගයන ලද අතර (රූපයේ දක්වා ඇති පරිදි) ලබාගප

| රේඛාව දිගේ දුර (මී) | ඔටෝ ලෙවලය මගින් සටහන් කල රේඛාව දිගේ උච්චත්වය (සෙමී) | නව උපකරණය මගින් සටහන් කල රේඛාව දිගේ උච්චත්වය (සෙමී) | දෙ සිර සා ෙ ( |
|---|---|---|---|
| 0 | 0.0 | 0.0±0.0 | 0. |
| 10 | 10.0 | 11.2±0.2 | 1. |
| 20 | 20.0 | 20.5±0.2 | 0. |
| 30 | 30.0 | 30.7±0.2 | 0. |
| 40 | 40.0 | 41.3±1.2 | 1. |
| 50 | 50.0 | 51.3±0.2 | 1. |
| 60 | 60.0 | 60.9±0.1 | 0. |
| 70 | 70.0 | 70.8±0.6 | 0. |
| 80 | 80.0 | 79.9±0.3 | 0. |
| 90 | 90.0 | 89.8±0.0 | 0. |

# ‍ූනය අවම කර ගැනීමට
# ා උදව් වන සරල උපකරණයක්

ැස් මට්ටමෙන් ලබාගෙන පාත්ති සකසයි.
) හැකි නොවන අතර ඉහත සඳහන් කළ
ට මෙවැනි ඉඩම්වල ඉතා ඉහළ අවදානමක්
ම සඳහා ගොවීන් විසින්ම සකසා ගත හැකි,
ර්යේෂණ ආයතනය මගින් සකසා ඇත.

දර්රු කර්මාන්තයේදී භාවිතා කෙරෙන
ින් මෙම උපකරණය සකසා ඇත. මෙහි
ුමක් සහිතවන පරිදි අදාල මට්ටම් අගය
ම සරල උපකරණය සකසා ගැනීමට අවශ්‍ය

සහිත විනිවිද පෙනෙන ප්ලාස්ටික් බටයක්
මය හඳුන්වයි)
විශ්කම්බය ඇති ඇලුමිනියම් බට කැබලි

ුයක්
ක්




දත්ත වගුවේ දැක්වා ඇත.

| ්බා අතර අතට ්ක්ෂ නස ෂමී) | රේබා දෙක අතර තිරස් අතට සාපේක්ෂ වෙනස (සෙමී) | ඔටෝ ලෙවලය මගින් සටහන් කල රේබාව සඳහා ගතවූ කාලය (මි) | නව උපකරණය මගින් සටහන් කල රේබාව සඳහා ගතවූ කාලය (මි) |
|---|---|---|---|
| ±0.0 | 0.0±0.0 | 4.0±1.5 | 2.3±0.3 |
| ±0.2 | 18.7±3.1 | 1.7±0.3 | 1.7±0.3 |
| ±0.2 | 22.0±7.3 | 2.7±0.7 | 2.3±0.3 |
| ±0.2 | 17.7±3.6 | 3.0±0.6 | 2.0±0.6 |
| ±2.0 | 13.3±3.5 | 2.3±0.3 | 2.3±0.3 |
| ±0.2 | 18.0±6.1 | 3.3±0.3 | 1.7±0.3 |
| ±0.1 | 16.7±1.3 | 2.0±0.0 | 2.0±0.6 |
| ±0.6 | 12.7±1.3 | 2.3±0.9 | 1.7±0.7 |
| ±0.3 | 11.0±0.6 | 2.0±0.0 | 2.9±0.7 |
| ±0.0 | 18.0±0.5 | 2.7±0.3 | 3.0±0.1 |




ඉහත වගුවේ පරිදි සිරස් අතට හෝ තිරස් අතට අදාල රේබාවේ ස්ථානීය වෙනස්වීමේ අගය, ඇලි වැටි වල ගැඹුර හා ඇලි දෙකක් අතර පරතරය සමග සැසඳීමේදී සාපේක්ෂව නොසලකා හැරිය හැකි මට්ටමක පවතී. ඒ අනුව නව උපකරණය උක් වගාවේ පාත්ති දිගේ ආනතිය නිසි පරිදි ලබාගැනීම සඳහා ප්‍රමාණවත් නිවැරදිතාවයක් සහිත බව සඳහන් කළ හැකිය.

මෙම උපකරණය භාවිතයෙන් වැටි සැකසීම සඳහා මට්ටම් ලබා ගැනීමේදී පහත සඳහන් ප්‍රධාන වාසි ලැබේ.


නව උපකරණය සෙවනගල ක්ෂේත්‍ර නිලධාරීන්ට හඳුන්වා දෙමින්

1. ඉතා අඩු මුදලකින් ගොවි මහතාටම සකසාගත හැකි වීම.
2. දේශීය වෙළඳපොලේ සුලභ අමුද්‍රව්‍ය පමණක් අවශ්‍ය වීම.
3. තාක්ෂණිකව සරල නිසා ගොවි මහතාටම භාවිතා කළ හැකි වීම.
4. ඉතා අඩු කාලයකදී උක් ඉඩම ආවරණය වන පරිදි පාත්ති සැකසීම සඳහා රේබා සටහන් කර ගැනීමට හැකි වීම.

මෙම උපකරණය උක් ගොවි ජනතාව අතර ප්‍රචලිත කිරීම අදාළ උක් කර්මාන්ත ආයතනයන්හි මැදිහත්වීම තුලින් පහසුවෙන් සිදුකළ හැකිය. එමගින් දිගුකාලීන වාසි ලෙස උක් ඉඩම් වල පාංශු ඛාදනය අවම කරගත හැකි වන අතර ජලසම්පාදන කාර්යක්ෂමතාව ඉහළයාම තුලින් උක් වගාවේ ලාබදායීතවය ඉහළ නැංවීමටද හැකිවේ.

**විශේෂ ස්තූතිය :** මෙම උපකරණය ක්ෂේත්‍ර පරීක්ෂාවේදී අතුල සිරිදේව මහතා (කෘෂි ව්‍යාප්ති කලමණාකාර, ලංකා සීනි සමාගම, සෙවනගල) අප වෙත දක්වන ලද සහයෝගය ඉතා අගයකොට සලකන්නෙමු.

**එල්.එම්.ජේ.ආර්. විජයවර්ධන, පර්යේෂණ නිලධාරී (ජල කළමනාකරණය),**
**සහ බී.පී.පී.එස්. සඳනායක (ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී)**
**බෝග සහ සම්පත් කළමණාකරන අංශය**
**උක් පර්යේෂණ ආයතනය**

# සීනි කර්මාන්ත තොරතුරු 2017

## නිෂ්පාදන තොරතුරු

| නිෂ්පාදන දත්ත | ඒකක | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|
| උක් වගාව සහිත සම්පූර්ණ භූමි ප්‍රමාණය (නිරි වගාවන් ඇතුලත්ව) | හෙක්ටයර | 14,800 | 15,926 | 16,128 | 18,344 | 16,349 |
| අස්වනු නෙලූ භූමි ප්‍රමාණය | හෙක්ටයර | 11,100 | 11,945 | 12,096 | 13,758 | 12,262 |
| ඇඹරූ උක් දඬු ප්‍රමාණය | මෙ.ටො. | 644,000 | 657,000 | 750,000 | 798,000 | 748,000 |
| සාමාන්‍ය අස්වැන්න | මෙ.ටො./හෙ. | 58 | 55 | 62 | 58 | 61 |
| සීනි නිෂ්පාදනය | මෙ.ටො. | 53,000 | 52,000 | 56,000 | 61,000 | 56,000 |
| සීනි උකහාගැනීමේ ප්‍රතිශතය | මෙ.ටො. | 8.2 | 8.0 | 7.5 | 7.7 | 7.4 |
| සීනි ආනයනය | මෙ.ටො. | 548,000 | 520,000 | 624,000 | 651,000 | 498,000 |
| සීනි ආනයන වියදම | රු. බිලියන | 37 | 33 | 34 | 49 | 39 |

## නිෂ්පාදන පිරිවැය හා ආදායම (රු.)

### සෙවනගල - වර්ෂාපෝෂිත

| ක්‍රියාකාරකම | පැල වගාව | නිරි වගාව | අවු. 04ක සමාන්‍ය |
|---|---|---|---|
| බිම සැකසීම | 28,148 | | |
| සීටුවීම/නිරි කිරීම | 78,205 | 23,000 | |
| පොහොර යෙදීම | 27,500 | 36,749 | |
| වල් පැලෑටි මර්දනය | 36.744 | 29,033 | |
| ජලය සැපයීම | 0 | 0 | |
| අස්වනු නෙලීම හා පැටවීම | 117,000 | 111,000 | |
| අනෙකුත් පාලන කටයුතු | 24,000 | 0 | |
| පොලිය(අමුද්‍රව්‍ය) | 12.470 | 3,405 | |
| මුළු වියදම | 324,094 | 203,188 | 237,164 |
| අස්වැන්න (හෙ.ට මෙ.ටොන්) | 78 | 74 | 71 |
| දළ ආදායම | 390,000 | 390,000 | 356,250 |
| ශුද්ධ ආදායම | 65,905 | 166,812 | 119,086 |

### සෙවනගල - වාරි පෝෂිත

| ක්‍රියාකාරකම | පැල වගාව | නිරි වගාව | අවු. 04ක සමාන්‍ය |
|---|---|---|---|
| බිම සැකසීම | 28,175 | | |
| සීටුවීම/නිරි කිරීම | 65,300 | 22,975 | |
| පොහොර යෙදීම | 29,000 | 36,749 | |
| වල් පැලෑටි මර්දනය | 38,533 | 34,033 | |
| ජලය සැපයීම | 30,500 | 23,000 | |
| අස්වනු නෙලීම හා පැටවීම | 147,000 | 136,500 | |
| අනෙකුත් පාලන කටයුතු | 24,000 | 8,000 | |
| පොලිය(අමුද්‍රව්‍ය) | 11,004 | 3,633 | |
| මුළු වියදම | 375,013 | 256,891 | 28,071 |
| අස්වැන්න (හෙ.ට මෙ.ටොන්) | 98 | 91 | 89 |
| දළ ආදායම | 490,000 | 455,000 | 446,250 |
| ශුද්ධ ආදායම | 114,987 | 198,109 | 165,528 |



### පැල්වත්ත - වර්ෂාපෝෂිත

| ක්‍රියාකාරකම | පැල වගාව | නිරි වගාව | අවු. 04ක සමාන්‍ය |
|---|---|---|---|
| බිම සැකසීම | 29,250 | | |
| සීටුවීම/නිරි කිරීම | 53,750 | 22,150 | |
| පොහොර යෙදීම | 30,500 | 31,250 | |
| වල් පැලෑටි මර්දනය | 35,442 | 29,154 | |
| ජලය සැපයීම | 0 | 0 | |
| අස්වනු නෙලීම හා පැටවීම | 71,500 | 78,000 | |
| අනෙකුත් පාලන කටයුතු | 6,250 | 8,000 | |
| පොලිය(අමුද්‍රව්‍ය) | 4,334 | 3,078 | |
| මුළු වියදම | 219,326 | 171,632 | 174,780 |
| අස්වැන්න (හෙ.ට මෙ.ටොන්) | 55 | 60 | 52 |
| දළ ආදායම | 275,000 | 300,000 | 260,000 |
| ශුද්ධ ආදායම | 55,674 | 128,367 | 85,219 |

### හිඟුරාන - වාරි පෝෂිත

| ක්‍රියාකාරකම | පැල වගාව | නිරි වගාව | අවු. 04ක සමාන්‍ය |
|---|---|---|---|
| බිම සැකසීම | 33,000 | | |
| සීටුවීම/නිරි කිරීම | 56,800 | 17,520 | |
| පොහොර යෙදීම | 47,300 | 44,800 | |
| වල් පැලෑටි මර්දනය | 30,258 | 27,858 | |
| ජලය සැපයීම | 18,500 | 18,000 | |
| අස්වනු නෙලීම හා පැටවීම | 127,500 | 105,000 | |
| අනෙකුත් පාලන කටයුතු | 18,000 | 6,000 | |
| පොලිය(අමුද්‍රව්‍ය) | 14,071 | 5,005 | |
| මුළු වියදම | 345,429 | 224,183 | 249,245 |
| අස්වැන්න (හෙ.ට මෙ.ටොන්) | 85 | 70 | 70 |
| දළ ආදායම | 425,000 | 350,000 | 350,000 |
| ශුද්ධ ආදායම | 79,571 | 125,317 | 100,755 |

මූලාශ්‍ර:- මහ බැංකු වාර්තා හා උක් පර්යේෂණ ආයතනයේ ආර්ථික විද්‍යා අංශයේ වාර්තා

(01 වැනි පිටුවෙන්....)

මේ වනවිට උක් පර්යේෂණ ආයතනය විසින් උක් ප්‍රභේද 21ක් දේශියව සංවර්ධනය කර හඳුන්වා දී ඇති අතර එම ප්‍රභේද අතුරින් උක් කර්මාන්තායතන හා ගොවීන්ගේ ඉල්ලුම පරිදි එස් එල් 96 128, එස් එල් 96 328, එස් එල් 95 4443, එස් එල් 92 4918, එස් එල් 83 06, එස් එල 90 6237, එස් එල් 92 5588, එස් එල් 98 2524 ප්‍රභේද හා 2017 වසරේ හඳුන්වාදුන් එස් එල් 00 95, එස් එල් 00 354, එස් එල් 00 652, එස් එල් 00 603, සහ එස් එල් 00 624 උක් පර්යේෂණ ආයතනය හා සීනි කර්මාන්තායතන ඒකාබද්ධව සැලසුම් කර ක්‍රියාත්මක කර ඇති නීරෝගී බීජ උක් නිෂ්පාදනය කර ගොවීන්ට ලබා දීමේ ව්‍යාපෘතිය යටතේ දැනට ප්‍රාථමික හා ද්විතීක තවාන් වල ගුණනය කරමින් පවතී. මෙම ප්‍රභේද වල මූලික බීජ උක් තවාන් උක් පර්යේෂණ ආයතන බීජ ගොවිපලෙහිත් ද්විතීක තවාන් උක් කර්මාන්තායතනයන්හිත් මේ වන විට ස්ථාපනය කරමින් පවතින අතර ඉදිරියේදී එමගින් ලබා ගන්නා බීජ උක් වගාකරුවන් වෙත ලබාදීම සඳහා සැළසුම් කර ඇත. එම ප්‍රභේද ක්ෂේත්‍ර ආදර්ශන මගින් වගාකරුවන් අතර ප්‍රචලිත කිරීමට නව ප්‍රභේද ප්‍රවර්ධන වැඩ සටහන යටතේ උක් පර්යේෂණ ආයතනය දැනටමත් කටයුතු කරමින් සිටී.







මෙම ප්‍රභේද අතරින් එස් එල් 83 06, එස එල් 92 5588, එස් එල් 90 6237 ප්‍රභේද රෝග හා පළිබෝධ හානි වලට වැඩි ඔරොත්තු දීමේ හැකියාවක් පෙන්වයි. එසේම එස් එල් 90 6237 ප්‍රභේදය නියඟ තත්වයන් වැනි අහිතකර දේශගුනික තත්ව යටතේත් ඉහළ අස්වැන්නක් ලබාදෙන වන සත්ව හානි අඩු ප්‍රභේදයක් වන අතර යාන්ත්‍රිකව අස්වනු නෙළීම සිදු කරන වගා බිම් සඳහා වඩාත් සුදුසුය.

**හකුරු නිෂ්පාදනයට නිර්දේශිත උක් ප්‍රභේද**

උක් පර්යේෂණ ආයතනය විසින් 1992 වසරේදී හඳුන්වා දුන් එස් එල් 8306 ප්‍රභේදය සහ 2012 සහ 2013 වසර වලදී හඳුන්වාදුන් එස් එල් 96 128 සහ 96 328, සහ 2017 දී හඳුන්වාදුන් එස් එල් 00 624 ප්‍රභේද වැඩි සීනි අස්වැන්නක් මෙන්ම ඉහළ ගුණාත්මයෙන් හා මනා පෙනුමකින් යුත් වැඩි හකුරු අස්වැන්නක් ලබාදෙන බැවින් මොණරාගල සහ




බදුල්ල දිස්ත්‍රික්ක ආදී දැනට උක් හකුරු නිෂ්පාදනය බහුලව කෙරෙන ප්‍රදේශවල එම කර්මාන්තය ඉහළ නැංවීම සඳහා වගා කිරීමට නිර්දේශ කර ඇත.

උක් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ ක්‍රියාදාමයේදී උක් අභිජනන වැඩසටහන යටතේ මෙතෙක් ඉහළ ප්‍රමුඛතාවයක් දී තිබුනේ වැඩි සීනි හා උක් අස්වැන්නක් සහිත රෝග හා පළිබෝධ හානි වලට ඔරොත්තු දෙන ප්‍රභේද සංවර්ධනය කිරීමටය. නමුත් උක් සීනි කර්මාන්තයේ අතුරුඵල ආශ්‍රිත කර්මාන්තයක් ලෙස වේගවත්ව සංවර්ධනය වන පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදන ක්ෂේත්‍රයටත් වඩාත් සුදුසු වන පරිදි සීනි වලට අමතරව වැඩි තන්තු ප්‍රතිශතයක් සහිත ප්‍රභේද මෙන්ම යාන්ත්‍රිකව අස්වනු නෙළීමට වඩාත් උචිත ලක්ෂණ සහිත ප්‍රභේද නිපදවා හඳුන්වාදීම කෙරෙහිද වැඩි අවධානයක් යොමු කර ඇත.

# නිසරු උක් වගාබිම් පුනරුත්ථාපනය ප්‍රවර්ධනයට ආදර්ශන ගොවි බිම්

පස නිසරුවීම හේතුවෙන් අඩු අස්වනු ලබාදෙන උක් ඉඩම් පුනරුත්ථාපනයට ආදර්ශන ගොවි බිම් තුලින් ගොවීන් උනන්දු කිරීමේ අරමුණින් උක් පර්යේෂණ ආයතනය පැල්වත්ත ලංකා සීනි සමාගමේ සහය ඇතිව වැඩ සටහනක් සැළසුම් කර ක්‍රියාත්මක කර ඇත. මෙම වැඩ සටහනෙහි ආරම්භක පියවර ලෙස පසුගිය වසරේදී පැල්වත්ත, මොනරාගල හා සියඹලාන්ඩුව ප්‍රදේශයන්හී පිටස්තර ගොවි බිම් මෙන්ම පැල්වත්ත සීනි සමාගම අශ්‍රිත ජනාවාස වගා බිම් ඇතුලත්ව තෝරාගත් ගොවි බිම් 16ක් ආදර්ශ වගා බිම් ලෙස සංවර්ධනය කර ඇත.

**දැනට බ්‍රසීලය වැනි සීනි කර්මාන්තයේ ඉදිරියෙන්ම සිටින රටවල් තම උක් වගා බිම් වල අස්වනු ඉහළ මට්ටමක පවත්වා ගැනීමට පෙරහන් මඩ යොදා ගෙන ඇති ආකාරය සැලකීමේදී, දේශිය සීනි කර්මාන්තයේ උක් බිම් වලද පෝෂණ තත්වය නැංවීමට පෙරහන් මඩ ඇතුළු කාබනික ද්‍රව්‍ය යොද ගැනීමට විශාල ඉඩකඩක් පවතී. ඒ සඳහා සීනි කර්මාන්තායතනයන්ගේ මැදිහත් වීමෙන් ක්‍රමවත් වැඩ පිළිවෙලක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමෙන් සමස්ත උක් නිෂ්පාදනය මෙන්ම ඒකක ගොවි බිමකින් ලබා ගන්නා අස්වැන්න වැඩි කරගැනීමට පියවර ගැනීම දේශීය සීනි කර්මාන්තයේ තිරසාර සංවර්ධනයට මහත් පිටුවහලක් වනු ඇත.**

මෙහිදී තෝරාගත් අඩු අස්වනු ලැබූ නිසරු බිම්වල අස්වනු නෙලා නව වගාවන් ස්ථාපනය සඳහා බිම් සැකසීමේදී ප්‍රධාන වශයෙන් දිරායාමට පත් පෙරහන් මඩ හෙක්ටයාරයකට ටොන් 10-15ත් පමණ ප්‍රමාණ වලින් පස සමග මිශ්‍ර කර පසේහි පෝෂණ තත්වය ඉහළ නැංවීමට කටයුතු කර ඇත. ඒ අනුව දැනටමත් සාරවත් වගාවන් ලෙස සාර්ථකත්වය පෙන්වා ඇති එම ආදර්ශන බිම් අනෙකුත් ගොවි මහතුන් සඳහා ආදර්ශනය කිරීමට පියවර ගෙන ඇත. එහිදී වගා බිම් ස්ථාපිත කිරීමට පියවර ගත් ගොවි මහතුන්ගේ මෙන්ම එම බිම් ක්ෂේත්‍ර ආදර්ශනයන්ට සහභාගීවූ ගොවින්ගේද යහපත් ප්‍රතිචාර මත 2018 වසරේදී තවත් තොරාගත් වගා බිම් සඳහා මෙම ආදර්ශන වැඩ සටහන ව්‍යාප්ත කිරීමටත් සැලසුම් කර ඇත.



වගා බිම් ගොවීන්ට ආදර්ශනය කරමින්



දැනට ශ්‍රී ලංකා උක් කර්මාන්තය සැලකීමේදී සාමාන්‍ය උක් අස්වැන්න අපට ආසන්න දේශගුනික තත්ව ඇති ඉන්දියාව වැනි රටවලට සාපේක්ෂව අඩු මට්ටමක පැවතීමට බලපා ඇති විවිධ හේතුන් අතර නිසරු තත්වයට පත් ගොවි බිම් වල අඩු අස්වනුද හේතුවී ඇත. එසේම පසේ නිසරු තත්වයන් ඇතිවීම නිසි පරිදි වගා පාලන කටයුතු කිරීම කෙරෙහි ගොවීන් ගේ උනනදුව අඩු වීමටත් හේතු වී ඇත. පසේ පොෂණ තත්වය ඉහළ නැංවීමට උක් වගා බිම් සඳහා පෙරහන් මඩ හා අනෙකුත් කාබනික ද්‍රව්‍ය යොදා ගැනීමට උක් පර්යේෂණ ආයතනය නිර්දේශ කර තිබූ අතරම මේ සඳහා ලබාදීමට උක් කර්මාන්තායතන සතුව දිරාපත්වන පෙරහන් මඩ ඇති නමුත් පැල්වත්ත සීනි කර්මාන්තායතනය ආශ්‍රිත අඩු ආදායම් සහිත ගොවීන් අවශ්‍ය ප්‍රවාහන හා කම්කරු වියදම් දැරීමට අපහසුවීම හේතුවෙන් මේ සඳහ අඩු නැඹුරුවක් පෙන්වයි. ඒ අනුව මෙම වැඩසටහනට තෝරාගත් ගොවි බිම් සඳහා පැල්වත්ත ලංකා සීනි සමාගම විසින් නොමිලේ සපයන ලද දිරායාමට පත් පෙරහන් මඩ උක් පර්යේෂණ ආයතනය විසින් ගොවි බිම් වෙත ප්‍රවාහනය කර දීමට පියවර ගෙන ඇත.

විෂය උපදේශකත්වය
ආචාර්ය ඒ.පී. කීර්තිපාල, අධ්‍යක්ෂ
ආචාර්ය ඩබ්.ආර්.පී. විතාරම
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)
ආචාර්ය අරුණ විජේසූරිය ප්‍රධාන පර්යේෂණ නිළධාරි

සංස්කරණය හා පිටු සැකැස්ම
ආචාර්ය එම්. එස්. පෙරේරා මහතා
ප්‍රධාන පර්යේෂණ නිළධාරි



උක් කර්මාන්තයට අදාල ලිපි සැපයීමෙන් පුවත් හසුන ඉදිරි කලාපයන් සඳහා ඔබට දායක විය හැකි අතර, එම ලිපි ලේඛන සහ ඔබගේ අදහස් සහ යෝජනා පහත ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක,
පුවත් හසුන,
උක් පර්යේෂණ ආයතනය,
උඩවලව.